කාන්තාව සහ මාධ්‍ය සාමූහිකය
பெண்கள் மற்றும் ஊடகக் கூட்டமைப்பு
Women and Media Collective

SOCIAL SCIENTISTS' ASSOCIATION

## සංකල්ප සටහන් සහ නිබන්ධන ලබාගැනීම

කාන්තාව සහ මාධ්‍ය සාමූහිකය විසින් සමාජ විද්‍යාඥයින්ගේ සංගමය සමග සහයෝගිතාවයෙන් සංවිධානය කරන

# දකුණු ආසියාවේ ගෙවීම් නොලබන සුරැකුම් වැඩ සහ ස්ත්‍රී ශ්‍රමය ප්‍රතිසංවිධානය කිරීමේ දී සමානත්වය සහ යුක්තිය පිළිබඳ සමුළුව

**දිනය**: 2022 මැයි 25-26

**ස්ථානය**: ශ්‍රී ලංකාවේ සහභාගිකයින් සඳහා කොළඹදීත්
ශ්‍රී ලංකාවෙන් බැහැර සහභාගිකයින් සඳහා මාර්ගගත Zoom තාක්ෂණය ඔස්සේත් පැවැත්වේ.

**සහභාගිවන්නන්**: පර්යේෂකයන්, සමාජ ක්‍රියාකාරීන් සහ
දකුණු ආසියාවේ ගෙවීම් නොලබන සුරැකුම් වැඩවල යෙදෙන අය වෙනුවෙන් පෙනී සිටින්නන්

**සංක්ෂිප්ත බාරදීමේ අවසාන දිනය මාර්තු 28 දක්වා දීර්ඝකර ඇත.**

## සමුළුව පිළිබඳ විස්තර

ස්ත්‍රීන්ගේ වැඩ, ස්ත්‍රී පුරුෂ සමාජභාවය සහ දේශපාලනික ආර්ථිකය සහ විශේෂයෙන් ගෙවීම් නොලබන සුරැකුම් වැඩ පිළිබඳව පර්යේෂකයන්, ක්‍රියාකාරීන් සහ මතවාදී වශයෙන් පෙනී සිටින්නන්ට මෙම සමුළුවට සහභාගිවන්නන් ලෙස අයඳුම් කිරීමට ආරාධනා කෙරේ. තම පර්යේෂණ ඉදිරිපත් කරන තෝරාගත් කතුවරයින් සහ දකුණු ආසියාවේ ගෙවීම් නොලබන සුරැකුම් වැඩ පිළිගැනීම පිළිබඳව සාකච්ඡාව මෙහෙයවන විශේෂඥ මණ්ඩලයකින් මෙම සමුළුව සමන්විත වනු ඇත. සමුළුවට සහභාගි වන සියලුම දෙනා 2022 මාර්තු 20 වන විට කාන්තාව සහ මාධ්‍ය සාමූහිකය වෙත අයදුම් කරන ලෙස ආරාධනා කෙරේ.

නිබන්ධනයේ සංක්ෂිප්තය එවීම සඳහා පිවිසෙන්න:
https://womenandmedia.org/conference/

## නිබන්ධන ඉදිරිපත් කිරීම

කරුණාකර ඔබ එවීමට අදහස් කරන නිබන්ධනයේ සංක්ෂිප්තය තාවකාලික මාතෘකාව සමඟ ඉදිරිපත් කරන්න. සංක්ෂිප්තයක් ඉදිරිපත් කිරීමෙන් අනතුරුව තෝරාගනු ලබන සම්පූර්ණ නිබන්ධනයක් දකුණු ආසියාවේ ගෙවීම් නොලබන සුරැකුම් වැඩ පිළිබඳ මුද්‍රණය කෙරෙන විශේෂ කලාපය සඳහා තෝරාගත් බවට සහතික වීමක් නොකෙරේ.

අවසාන නිබන්ධනය (ද්විත්ව ඉඩ සහිත - Double Space) ටයිප් කළ පිටු 20 නොඉක්මවිය යුතුය. නිර්දේශිත සඳහන් කිරීමේ දී APA ශෛලිය අනුගමනය කළ යුතුය. සියලුම අත් පිටපත් වෙනත් අයගේ නිර්මාණවලින් ලබා ගත් ඒවාද (Plagiarism) යන්න සඳහා පරීක්ෂා කර විද්වත් කණ්ඩායමක් විසින් පුනරීක්ෂණ ක්‍රියාවලියකට ද ලක් කරනු ඇත.

* **සිංහල දෙමළ සහ ඉංග්‍රීසි භාෂාවෙන් සංක්ෂිප්ත එවිය හැක. වැඩි විස්තර සඳහා** https://womenandmedia.org/conference **පිවිසන්න.**

## කාල සීමාවන්

| | | |
|---|---|---|
| මාර්තු | 28 | සංක්ෂිප්තයන් ඉදිරිපත් කිරීමේ අවසාන දිනය |
| මාර්තු | 31 | සංක්ෂිප්තය තෝරාගැනීම පිළිබඳව දැනුම් දීම සහ ඉදිරිපත් කිරීම සඳහා ඇරයුම් කෙරෙන දිනය |
| අප්‍රේල් | 30 | සම්පූර්ණ නිබන්ධනය බාර දීමේ අවසාන දිනය |
| මැයි | 10 | පුනරීක්ෂණය කළ සම්පූර්ණ නිබන්ධනය එවිය යුතු අවසාන දිනය |

## අපේක්ෂිත නිමැවුම්

i. දැනට පවතින අභියෝග හඳුනා ගැනීම සහ ගෙවීම් නොලබන සුරැකුම් වැඩ හඳුනාගැනීම, වැඩබර අවම කිරීම සහ සුරැකුම් වැඩ නැවත බෙදාහැරීම පිළිබඳ උපාය මාර්ග
iii. ගෙවීම් නොලබන සුරැකුම් වැඩ හඳුනාගැනීම සහ මතවාදී පෙනී සිටීම වැඩි කිරීම සඳහා පසුවිපරම් ක්‍රියාකාරකම් සහ උපාය මාර්ග සඳහා හවුල්කාරීත්වයන්
iii. ගෙවීම් නොලබන සුරැකුම් වැඩ පිළිබඳ තෝරාගත් සමීක්ෂණ වාර්තා/නිබන්ධන ප්‍රකාශයට පත් කිරීම.

## අරමුණ

ඉහතින් මතුකර දක්වන ලද ගැටලු පිළිබඳව විශ්ලේෂණ සහ ආවර්ජණ ප්‍රවර්ධනය කිරීමේ අරමුණෙන් පහත ඉලක්ක මෙම සම්මේලනය පර්යේෂණවල සොයාගැනීම් ඉදිරිපත් කිරීමට සහ සාකච්ඡාවටත් පහත දැක්වෙන කරුණු දකුණු ආසියාවේ ගෙවීම් නොලබන සුරැකුම් වැඩ පිළිබඳ ප්‍රතිපත්ති මැදිහත්වීම් සඳහා දැනුවත් මතවාද සහ උපාය මාර්ග ඉදිරිපත් කිරීම සඳහා මණ්ඩපයක් වනු ඇත.

i. ගෙවීම් නොලබන සුරැකුම් වැඩවල දේශපාලන ආර්ථිකය
ii. සුරැකුම් වැඩ වෙනුවෙන් යොදන ලද කාලය පිළිබඳ සමීක්ෂණ සහ ගෙවීම් නොලබන වැඩ තක්සේරු කිරීම
iii. රාජ්‍ය ප්‍රතිපත්ති මැදිහත්වීම්
iv. සමීක්ෂණ, මතවාදය ඉදිරිපත් කිරීම සහ ප්‍රතිපත්ති සම්පාදකයන් අතර සන්ධාන ගොඩ නැගීම
v. සමාජ මාධ්‍ය මැදිහත්වීම් සහ පිළිගැනීම සහ සුරැකුම් සහභාගිත්වය සඳහා ඇති බලපෑම
vi. කොවිඩ් 19 බලපෑම් සහ සුරැකුම් වැඩවල දේශපාලනික ආර්ථිකය ප්‍රතිව්‍යුහගත කිරීම සඳහා උපාය මාර්ග

# පසුබිම

පවුලක් රැකබලා ගැනීමේ සුරැකුම් වැඩ කටයුතු විවිධ වූ පැතිමානයන්ගෙන් යුතුය. එය පුද්ගලයන්ගේ සංඛ්‍යාව, ඔවුන්ගේ වයස හෝ එහි සාමාජිකයන්ගේ අවශ්‍යතා හෝ ස්ත්‍රී පුරුෂ සමාජභාවය නොසලකා පවුලේ සමාජ ආර්ථික ගැළපීම හා බැඳී පවතී. රැකවරණය සැලසීම සංකල්පයක් වශයෙන් සහ ක්‍රියාකාරකමක් ලෙස වැඩි වශයෙන්ම ස්ත්‍රීන්ට සීමාවන් පවතී. පසුගිය දශක තුනක කාලය තුළ අවධානය යොමු වූයේ කුටුම්භය තුළ රැකවරණය නොහොත් සුරැකීම සමාජ, දේශපාලන හා ආර්ථික අදාළත්වය පිළිබඳ ස්ත්‍රී පුරුෂ සමාජභාවීය පරාර්ථකාමීත්වය පිළිබඳ හැඟීම් අභියෝගයට ලක් කළ අතර මෙම ගැටලුව ස්ත්‍රීවාදී කතිකාවේ කේන්ද්‍රීය, වාස්තවික සංයුතියක් බවට පත් කෙරිණ.

ගෙවීම් නොලබන සුරැකුම් වැඩ පිළිබඳව ස්ත්‍රීවාදී ගවේෂණය සහ සාක්ෂි ගොඩ නැගීම තුළින් ස්ත්‍රීන් ආර්ථික බලගැන්වීම, ස්ත්‍රී පුරුෂ අනන්‍යතා සහ මහජන ප්‍රතිපත්තියේ භූමිකාව පිළිබඳ පැතිමානයන් පෙරට ගෙන එන ලදී. ඉන් ගෙවීම් නොලබන සුරැකුම් වැඩවල දේශපාලන ආර්ථිකය පිළිගැනීමටත්, කුටුම්භය තුළ ස්ත්‍රී ශ්‍රමය ඇගයීමේ අවශ්‍යතාවයත් ඉදිරිපත් කෙරිණ. එය ගෙවීම් ලබන වැඩ වඩාත් වැදගත්ව තම කුටුම්බයන් තුළ ගෙවීම් නොලබන සුරැකුම් වැඩ තුළ කොවිඩ් 19 වැනි වසංගත තත්ත්වයන් වැනි ගෝලීය අර්බුදයන් තුළ ස්ත්‍රීන්ට කෙරෙන බලපෑම ඉස්මතු විය. ගෙවීම් නොලබන සුරැකුම් වැඩ පිළිගැනීම, වැඩබර අඩු කිරීම සහ සුරැකුම් වැඩ බෙදාහැරීම සහ නැවත බෙදාගැනීම මිනුම්ගත කිරීම වෙනත් කලාපවල මෙන්ම දකුණු ආසියාවේ ද මූලික කරුණකි.

ගෙවීම් නොලබන සුරැකුම් වැඩ පිළිබඳව දැනට සිදුවෙමින් පවතින සාකච්ඡාවට සහ සංවාදයට ගෙවීම් ලබන වැඩවල කාන්තා සහභාගිත්වය අතර ඇති සම්බන්ධතාවය නොකඩවාම නැවත විමසා බැලීම සහ ගැඹුරු අර්ථාන්විත විශ්ලේෂණයක් ද ඇතුළත් වේ. ඊට ජාතික ශ්‍රම බලකායට ඇතුළත්වීම සහ පවුල සහ කුටුම්භය තුළ ස්ත්‍රී ශ්‍රමයේ ආර්ථික සහ සමාජයීය වටිනාකම ඇතුළත් වේ. බොහෝ අන්තර්ජාතික සංවර්ධන ආයතන දැන් ළමුන් රැකබලාගැනීම, වැඩිහිටියන් රැකබලාගැනීම සහ ආබාධිත තත්ත්වයන් සහිත යැපෙන්නන් රැකබලාගැනීම ඇතුළත් සුරැකුම් සේවා සැපයීමේ අවශ්‍යතාවය පිළිගනී. මූලික අවධානයක්ව පවතින්නේ බාල වයසේ ළමයින් ඇති පවුල් සඳහාත්, ආබාධිත තත්ත්වයන් සහිත පුද්ගලයන් සඳහාත්, වැඩිහිටියන් සඳහාත් රැකවරණ පහසුකම් සැපයීම සඳහා අයවැය ප්‍රතිපාදන වෙන් කිරීම ගැන ය.

බොහෝ දකුණු ආසියානු රටවල දරිද්‍රතාවයට පත්ව ඇතැයි නම් කර ඇති කුටුම්බ සඳහා සමාජ ආරක්ෂණ වැඩ සටහන්වලට ජාතික අය-වැයෙන් ප්‍රතිපාදන වෙන් කර ඇත. කෙසේ වුවත් එවැනි වැඩසටහන් බොහොමයක් සකස් කොට ඇත්තේ මූලික වගකීම කාන්තාවට පැවරෙන පවුලේ රැකවරණය සැපයීම ස්ත්‍රී පුරුෂ සමාජභාවීය පිළිගැනීම හැඟවෙන ආකාරයට ය. ශ්‍රම බලකායේ පාර්ශ්වයක් වීමට ස්ත්‍රීන්ට ආදායම් ඉපැයීමේ ක්‍රියාකාරකම්වල යෙදීමට හැකියාව ලබා දීම ඉදිරිපත් කරන්නේ දළ දේශීය නිෂ්පාදිතයේ වර්ධනය සඳහා වූ දිව ඔසුවක් සේය. ඒ සමගම සංස්කෘතික නියමයන් සහ ස්ත්‍රී පුරුෂ සමාජභාවීය භූමිකා පිළිබඳ සංකල්ප ගෙවීම් නොලබන වැඩවල ගෘහස්ථ බෙදීම දිගටම පවත්වා ගැනීම සඳහා තර්කයක් සේ ගෙනහැර දක්වයි. කලාපයේ ස්ත්‍රීන් වැඩියෙන් ශ්‍රම බලකායට සම්බන්ධ වන නමුත් ගෘහස්ථ සහ ප්‍රජා මට්ටමේත් ජාතික ආර්ථිකයේත් ගෙවීම් නොලබන සුරැකුම් වැඩවල වටිනාකමේ ප්‍රතිපත්තිමය පිළිගැනීමක් මෙතෙක් දක්නට නැත. පීතෘ නිවාඩු වැනි අර්ථාන්විත ප්‍රතිපාදන හඳුන්වාදීම සහ ක්‍රියාත්මක වීම වැනි මැදිහත්වීම් හෝ කුටුම්බයන්ට පිවිසිය හැකි හොඳින් සම්පූර්ණ වූ පහසුකම් සැපයීම කලාපයේ බොහෝ ප්‍රතිපත්ති සම්පාදනයෙන් මතුවන සමහර අවධානයන් අතර වේ.

කොවිඩ් 19 ප්‍රතිඵලයක් වශයෙන් මතු වූ සමාජ ආර්ථික කැළඹීම ස්ත්‍රීන් සිදු කරන ගෙවීම් නොලබන සුරැකුම් වැඩවල පීඩනයේ ප්‍රමාණය ඉස්මතු කරයි. මෙම සාධක ගෝලීය වශයෙන් විශේෂයෙන්ම දකුණු ආසියාවේ ස්ත්‍රීවාදී පර්යේෂකයන්ට සහ ක්‍රියාකාරීන්ට ස්ත්‍රී ශ්‍රමය පිළිබඳ කතිකාව දෙසට නැවත යොමුවීම සහ ගෙවීම් නොලබන සුරැකුම් වැඩ පිළිගැනීමේදී සමානත්වය සහ යුක්තිය පිළිබඳ කරුණු ගවේෂණයේ හදිසි අවශ්‍යතාවය ශක්තිමත් කරවයි.

**For more info:** https://womenandmedia.org/conference

**කාන්තාව සහ මාධ්‍ය සාමූහිකය**
56/1, සරසවි ලේන්, කාසල් වීදිය,
කොළඹ 08, ශ්‍රී ලංකාව

UCW.SAconf@gmail.com

womenandmedia.org

**සංවිධානය: සමාජ විද්‍යාඥයින්ගේ සංගමය සමග සහයෝගිතාවයෙන් කාන්තාව සහ මාධ්‍ය සාමූහිකය විසිනි**